සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
சபரகமுவ மாகாண கல்வித் திணைக்களம்
**Sabaragamuwa Provincial Department of Education**

| | | |
|---|---|---|
| පළමු වාර පරීක්ෂණය | 2018 | 11 ශ්‍රේණිය |
| முதலாம் தவணைப் பரீட்சை | 2018 | தரம் 11 |
| **First Term Test** | **2018** | **Grade 11** |

| | |
|---|---|
| *නාට්‍ය හා රංග කලාව - I* | *පැය එකයි* |
| ***Drama and Theatre - I*** | ***One Hour*** |

**නම/විභාග අංකය :- ..........................................................................................**

සැලකිය යුතුයි.

- ❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- ❖ අංක 1 - 40 දක්වා ප්‍රශ්න වලට 1 2 3 4 වරණ වලින් නිවැරදි වරණය තෝරන්න.
- ❖ පිළිතුරු සැපයීම සඳහා ඔබට ලබා දෙන කොටු කොළය භාවිතා කරන්න.

- පහත දැක්වෙන පද්‍ය කොටස් ඇසුරු කර ගනිමින් 01 සිට 06 දක්වා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

I වෙදා නටන්නේ පළමුව සබයට එන්නේ
යොදා කියන්නේ තාලෙට ගත වෙව්ලන්නේ
කුදා වැනෙන්නේ සබයේ කොක් හඬලන්නේ
විදා පාන්නේ අත් දෙක තැගි කියන්නේ

II අසාලා වගතුග සියල්ලක්
යොදාලා ගත්තෙ බොරුබස් ඇසිල්ලක්
රවාලා කිව්වෙ අප හට දෝසයක්
කපාලා දෙමිය ගමමහගේ බරට ගාතයක්

III වඩිගපුර දේසෙන්
සත්දෙන බමුණු ඇවිදින්
කළ වඩිග පටුනින්
මෙසේ බමුණෝ යාග කරමින්

IV පුර සඳ පායා දිලෙන වැනී
මුහුණ තිගේ
දිලෙන වැනී මුහුණ තිගේ
සීදේවි මාගේ කිට්ටු වෙයන්කෝ

V ලප නොම වන් සඳසේ සොම් ගුණෙනා
ආදර දිනෙනා සිසු සැවොමා

VI රූ සිරින් අහනක් මනා
නැත මේ ලොව අන් කිසි තැනා
මේ ලෙසින් සිතමින් මෙනා
බල ලෙන්විනා එන සෝබනා

01. උඩරට ගැමි නාටකයක ඇතුළත් ගීත කාණ්ඩයක් ඇතුළත් වරණය වන්නේ

1. I　　2. II　　3. III　　4. IV

02. පහත රට ශාන්ති කර්මයකට අයත් ගීත කාණ්ඩය ඇතුළත් පිළිතුර වන්නේ

1. I　　2. III　　3. IV　　4. V

03. නාඩගම් සම්ප්‍රදාය පදනම් කොට ගෙන නිර්මාණය වූ නාට්‍යක ඇතුළත් ගීත කාණ්ඩය ඇතුළත් පිළිතුර වන්නේ

1. II　　2. III　　3. IV　　4. V

04. පහත රට ගැමි නාටකයක අඩංගු ගීත කාණ්ඩයක් දැක්වෙන පිළිතුර වන්නේ,

1. I　　2. II　　3. IV　　4. VI

05. නූතන නාට්‍ය කලාවේ සන්ධිස්ථානය සනිටුහන් කරන නාට්‍යක ඇතුළත් ගීත කාණ්ඩයක් වන්නේ,

1. I
2. IV
3. V
4. VI

06. කොහොඹා කංකාරි ශාන්ති කර්මය හා බැඳි ගීත කොටසක් අඩංගු පිළිතුර වන්නේ,

1. I
2. II
3. III
4. VI

- 07 සිට 11 සඳහා ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරන්න.

07. අංග රචනාවක් සිදු කිරීමේදී පදනම් ආලේපයක් ලෙස යොදා ගන්නේ,
1. ලයිනින් කලර්ස්
2. රිමූවින් ක්‍රීම්
3. පෑන් කේක්
4. පවුඩර් පෆ්

08. ශ්‍රීලංකාවේ ප්‍රසිද්ධ අංග රචනා ශිල්පියෙකු ලෙස දැක්විය හැක්කේ,
1. ජගත් පද්මසිරි මහතා.
2. ජගත් බෙනරගම මහතා.
3. දයානන්ද ගුණවර්ධන මහතා.
4. පරාක්‍රම නිරිඇල්ල මහතා.

09. අංග රචනය පිළිබඳ අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. නළුවාගේ මුහුණ අලංකාර කිරීමට යොදා ගනී.
2. නාට්‍යයේ රංග ශෛලියට අනුරූපව යොදා ගනී.
3. නළුවා රඟන චරිතයේ ස්භාවය අනුව යොදා ගනී.
4. සාත්වික අභිනය තීව්‍ර කිරීමට යොදා ගනී.

10. නළුවෙකුට දෙබස් උච්චාරණය කිරීමේ ශක්තිය වර්ධනය කර ගැනීම සඳහා භාවිතා කළ හැකි අභ්‍යාසයකි.
1. ස්වසන අභ්‍යාස
2. ශිථිලකරණ අභ්‍යාස
3. මානසිකඅභ්‍යාස
4. සංවේදන අභ්‍යාස

11. තරංගාට රංගනයේදී අක්ෂි සබඳතාවය පවත්වාගත නොහැක.ඇයගේ එම දුර්වලතාවය මගහරවා ගැනීමට ඔබ යෝජනා කරනු ලබන අභ්‍යාසය වන්නේ කුමක්ද?
1. හඬ අභ්‍යාසය
2. මානසිකඅභ්‍යාස
3. දර්පන අභ්‍යාසය
4. ශිථිලකරණ අභ්‍යාස

- 12 සිට 17 දක්වා පහත වගුව ඇසුරු කොට ගනිමින් පිළිතුරු සපයන්න.

| නාට්‍යයේ නම | මුල් කෘතියේ රචකයා | පරිවර්තනයේ අනුවර්තනයේ නම | මෙරට නිෂ්පාදකයාගේ නම |
|---|---|---|---|
| ද ඩ්‍රැගන් | ක | ග | ජ |
| ට | ඞ | තුරඟ සන්නිය | ණ |

12. වගුවේ "ක" කොටුවේ සඳහන් විය යුතු නම කුමක්ද?
1. ලුයිජි පිරැන්ඩෙලෝ
2. එව්ගිනිෂ්වාත්ස්
3. බර්ටෝල්ට් බ්‍රෙෂ්ට්
4. පීටර් වයිස්

13. වගුවේ "ග" කොටුවේ සඳහන් විය යුතු නම කුමක්ද?
1. වෙස් මුහුණු
2. මරාසාද්
3. මකරා
4. මහ ගෙදර

14. වගුවේ "ජ" කොටුවේ සඳහන් විය යුතු නම කුමක්ද?
1. හෙන්රි ජයසේන
2. රංජිත් ධර්මකීර්ති
3. පරාක්‍රම නිරිඇල්ල
4. ධම්ම ජාගොඩ

15. වගුවේ "ට" කොටුවේ සඳහන් විය යුතු නම කුමක්ද?
1. ද රයිවල්ස්
2. දි එල්ඩර් කින්
3. ද පබ්ලික් එනිමි
4. ද හෝස්

16. වගුවේ "ඞ" කොටුවේ සඳහන් විය යුතු නම කුමක්ද?
1. ඇන්ටන් චෙකෝෆ්
2. සැමුවෙල් බෙකට්
3. ජුලියස් හේ
4. ප්ලෝටස්

17. වගුවේ "ක" කොටුවේ සඳහන් විය යුතු නම කුමක්ද?

1. බන්ධුල විතානගේ
2. සුගතපාලද සිල්වා
3. විජිත ගුණරත්න
4. සුනන්ද මහේන්ද්‍ර

- පහත දැක්වෙන ඡායාරූපය ආශ්‍රයෙන් 18 සිට 20 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.



18. ඉහත ඡායා රූපයෙන් දැක්වෙන නාට්‍ය වනුයේ,

1. බෙරහඬ 2. රත්තරං 3. දික්තල කාලගෝල 4. වෙල්ල වැහුම්


19. මෙම ඡායාරූපයේ දැක්වෙන රංගන ශිල්පියා වනුයේ,

1. රුවන් දනන්සූරිය 2. රිචඩ් මානමුදලි 3. සමන් ගුණසිංහ 4. උදේනි චන්ද්‍රසිරි

20. මෙම ඡායාරූපයේ දැක්වෙන රංගන ශිල්පිනිය වනුයේ,

1. මාදිනී මල්වත්ත
2. මැණිකේ අත්තනායක
3. චන්ද්‍රාණී පතිරණ
4. මානෙල් ජයසේන

21. මෙම ඡායාරූපයේ දැක්වෙන රංගන ශිල්පියා වනුයේ,



1. ජැක්සන් ඇන්තනී ය.
2. ශ්‍රියන්ත මෙන්ඩිස් ය.
3. රොඩ්නි වර්ණකුල ය.
4. ප්‍රියන්ත සෙනෙවිරත්න ය.

22. ඔහු රංගනයට අවතීර්ණ වූයේ පහත කුමන නාට්‍යකට රංගන දායකත්වය ලබා දෙමින්ද?

1. මෝරා 2. අනේ අබිලින් 3. එව බලව 4. ඔත්තුකාරයා

- පහත දැක්වෙන තොරතුරු ආශ්‍රයෙන් 23 සිට 28 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

A දෙවොල් මඩු B සොකරි C කොහොඹා කංකාරිය
D සූනියම් යාගය E රට යකුම F සන්නියකුම G කෝලම්

23. සශ්‍රීකත්වය මෙන්ම විනෝදාස්වාදය ද ලබාදීමේ අරමුණින් පවත්වනු ලබන ගැමි නාටක වන්නේ,

1. AD 2. BG 3. EG 4. CB

24. පුරාවෘත්තයෙන් වඳ බිසවුන් සත් දෙනෙකු පිළිබඳ සඳහන් වන ශාන්ති කර්මය වනුයේ,

1. A 2. C 3. E 4. G

25. පහතරට ප්‍රදේශයට අයත් ශාන්ති කර්මයන් අන්තර්ගත වරණය වන්නේ

1. ADGF 2. ADEF 3. ADCF 4. ABDF

26. උඩරට ප්‍රදේශයට ආවේණික ගැමි නාට්‍යයක් හා ශාන්ති කර්මයක් පිළිවෙළින් දැක්වෙනුයේ,

1. CB 2. BA 3. CD 4. BC

27. වෙස්මුහුණු භාවිතය සුවිශේෂී කොටගත් ගැමි නාටකයක් වනුයේ,

1. B 2. D 3. E 4. G

28. අඹ විදමන නම් නාට්‍යමය අවස්ථාව අන්තර්ගත ශාන්ති කර්මයකි.

1. A 2. C 3. D 4. E

- පහත සඳහන් ප්‍රශ්ණ සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

29. නාට්‍යකදී වේදිකාවක් මත මොහොතින් මොහොත මැවෙන දර්ශනය හඳුන්වනු ලබන්නේ

1. ප්‍රේක්ෂාවයි 2. මායාව යි 3. රසභාවයි 4. රූපණය යි

30. නාට්‍යයේ සංගීතය තුළින්,

1. නාට්‍යයේ හිස්තැන් පිරවීම සිදුකරයි. 2. ප්‍රේක්ෂකයා පිනවීම සඳහා යොදා ගනී.
3. නාට්‍යයේ භාවයන් උද්දීපනයට යොදාගනී. 4. නාට්‍යයේ අර්ථය හීන කිරීමට යොදා ගනී.

31. රංග විධාන යනුවෙන් අදහස් කෙරෙන්නේ,

1. නාට්‍ය අධ්‍යක්ෂක, නළු නිළියන්ට ලබාදෙන උපදෙස් ය.
2. නළු නිළියන්ට හා අධ්‍යක්ෂකට නාට්‍ය පෙළෙහි දී ඇති උපදෙස් ය.
3. අධ්‍යක්ෂක වරයා විසින් පෙළ රචකයාට ලබා දෙන උපදෙස් ය.
4. පෙළ රචකයා විසින් ප්‍රේක්ෂකයන්ට ලබා දෙන උපදෙස් ය.

32. සුගතපාලද සිල්වා මහතා තම වේදිකා නාට්‍ය අත්දැකීම් ඇසුරුකොට ගනිමින් රචනා කරන ලද කෘතිය වන්නේ,

1. ගැමි නාටකය 2. නාට්‍ය ප්‍රවේශය
3. සොඳුරු ආඥාදායකයා 4. සාන්තුවර සෙබලාණෝ

33. දක්ෂ රංග වින්‍යාසකරුවෙකු වශයෙන් සිංහල හා ඉංග්‍රීසි වේදිකාව තුළ වඩාත් ප්‍රකට පුද්ගලයෙකි,

1. ධම්ම ජාගොඩ 2. ජේරම් ලක්ෂ්මන්ද සිල්වා
3. රුවන්ති ද චිකේරා 4. අර්න්ස්ට් මැකින්ටයර්

34. බලිවාලා ප්‍රමුඛ පාර්සි නාට්‍ය කණ්ඩායම විසින් මෙරටට හඳුන්වාදුන් නාට්‍ය ප්‍රභේදය වන්නේ,

1. කෝළම් ය. 2. නාඩගම් ය. 3. සොකරි ය. 4. නූර්ති ය.

35. මුල්ම සිංහල නූර්තිය ලෙස සැලකෙන්නේ,

1. නාගානන්ද 2. සිවම්මා ධනපාල 3. රොලීනා 4. පණ්ඩුකාභය

- පහත වගුව ඇසුරු කර ගනිමින් 36 සිට 38 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

| ක | ග | ජ |
|---|---|---|
| දිරිය මව සහ ඇගේ දරුවෝ | පුස්ලෝඩං | සුභ සහ යස |
| අහස් මාලිගා | පණ්ඩුකාභය | කුවේණි |
| ඇත්ත කුමක්ද? | සුදු සහ කළු | සිංහබාහු |

36. ඉහත වගුවේ **"ක"** ගොනුවේ ඇතුළත් නාට්‍යය,

1. ජයලත් මනෝරත්නයන් විසින් නිර්මාණය කළ ස්වත්‍රන්ත නාට්‍ය තුනකි.
2. ආදි විශ්වවිද්‍යාලීය සිංහල සංගමය මගින් නිර්මාණය කළ නාට්‍ය තුනකි.
3. හෙන්රි ජයසේනයන් විසින් නිර්මාණය කළ පරිවර්තන නාට්‍ය තුනකි.
4. බර්නාඩ් ෂෝ ගේ නිර්මාණ ආශ්‍රයෙන් පරිවර්තනය කරනු ලැබූ නාට්‍ය තුනකි.

37. ඉහත වගුවේ **"ග"** ගොනුවේ ඇතුළත් නාට්‍ය,

1. සුගතපාල ද සිල්වා විසින් රචිත ස්වතන්ත්‍ර නාට්‍ය තුනකි.
2. සයිමන් නවගත්තේගම විසින් රචිත ස්වතන්ත්‍ර නාට්‍ය තුනකි.
3. පරාක්‍රම නිරිඇල්ල විසින් රචිත ස්වතන්ත්‍ර නාට්‍ය තුනකි.
4. බන්ධුල ජයවර්ධන විසින් රචිත ස්වතන්ත්‍ර නාට්‍ය තුනකි.

38. ඉහත වගුවේ **"ජ"** ගොනුවේ ඇතුළත් නාට්‍ය,

1. පේරාදෙණිය විශ්වවිද්‍යාලය මගින් නිෂ්පාදනය කළ නාට්‍ය වේ.
2. ඓතිහාසික සිද්ධීන් පදනම් කර ගත් නාට්‍ය වේ.
3. අනුවර්තන නාට්‍ය තුනක් වේ.
4. එදිරිවීර සරච්චන්ද්‍ර හා හෙන්රි ජයසේනයන්ගේ නිර්මාණයන් වේ .

- පහත 39 හා 40 ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරන්න.

39. රංග රචනයේදී වඩාත් සැලකිල්ලට ගත යුත්තේ,

1. පසුතල නිර්මාණය ,වේදිකා අලංකරණය හා නර්තනය යි.
2. දෘශ්‍යමය ප්‍රබලත්වය හා ,අර්ථ ප්‍රකාශනය හා නිර්මාණාත්මක බව යි.
3. අංග රචනයේ ප්‍රබල බව ,රංගාලෝකය හා සංගීතය යි.
4. නාට්‍ය උපකරණ , නිර්මාණාත්මක බව හා වේෂභූෂණය යි .

40. නාට්‍යයක් නිර්මාණය කළ පසු එහි පැවැත්ම රඳා පවතින්නේ,

1. අධ්‍යක්ෂක හා නළු නිළියන් මත ය.
2. ආනුශාංගික ශිල්පීන් මත ය.
3. ප්‍රේක්ෂක ප්‍රතිචාරය මත ය.
4. වේදිකා ගත වන කාල වකවානුව මත ය.